# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2382/24 – 2024 මැයි මස 03 වැනි සිකුරාදා – 2024.05.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද සහ අංක 30 ඒ, මලලසේකර මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්-

(1) එකී පනත යටතේ සාදන ලද සහ 2022 ඔක්තෝබර් මස 19 වන දින අංක 2302/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත පරිදි වූ 2013 මාර්තු මස 12 වන දින අංක 1801/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) "මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචනවල සිට "මේ නියමය මගින් ප්‍රදානය කර සිටිමි" යන වචන දක්වා වූ සියලුම වචන වෙනුවට, "මේ නියමය මගින්, I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති, එයට අනුරූපව මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අදාළ කෙටි යෙදුම් දක්වා ඇති උපාධි ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) පිළිගනු ලැබේ." යන වචන ආදේශ කිරීමෙන්, සහ

(ආ) නියමයේ උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කිරීමෙන්.-

1A – PG6711 – 284 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**“I වන උපලේඛනය**

***කොන්දේසි***

1. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළ යුතු, (SLQF 6 වන මට්ටම) ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් සහ අවම අධ්‍යයන සම්භාර 90 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 5 වන මට්ටම) ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සම්බන්ධයෙන් -

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ “සාමාන්‍ය සාමාර්ථ” (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම, සහ

(ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයය සඳහා “සම්මාන සාමාර්ථයක්” (C) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධි පාඨමාලාව* | *II වන තීරය*<br>*උපාධි පාඨමාලාවන් සඳහා වන කෙටි යෙදුම්* |
|---|---|
| ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව ඒඒ |
| ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී | බීඑස්සීඒඒ |

(2) 2022 ඔක්තෝබර් මස 19 වන දින අංක 2302/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ, සහ

(3) මේ නියමය 2022 ඔක්තෝබර් මස 19 වන දින සිට ක්‍රියාත්මක වූ බව සලකනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2024 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 – 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.